**විසර්ජන ශීර්ෂය 115 - ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

**---**

## 1.1 විගණන විෂය පථය

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විගණන සාක්ෂි නොවීම

2012 වර්ෂය තුළ අමාත්‍ය කාර්යාලයෙහි හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයෙහි සේවයේ නියුතුව සිටි නිලධාරීන් 37 ක් වෙනුවෙන් අතිකාල හා ගමන් වියදම් වශයෙන් රු.3,038,981 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ගෙවා තිබුණද, මෙම නිලධාරීන්ගේ පැමිණීම් හා පිටවීම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ආ)** **විසර්ජන ගිණුම**

**(i)** **මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.111,450,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.100,165,799 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.11,284,201 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 101,000,000 | 100,600,000 | 6,123,619 | 6 |
| මූලධන | 7,450,000 | 10,850,000 | 5,160,582 | 48 |
| එකතුව | 108,450,000 | 111,450,000 | 11,284,201 | |

**(ii)** **අයවැය විචලනය**

- වැය විෂයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.3,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.
- වැය විෂයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 60 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

**(ඇ)** **රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්:**

විෂය අංක 11501 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 3,500,000 | 1,895,800 | 1,200,000 | 2,428,226 | 11,200,000 | 8,382,807 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 11501 දරන රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.244,406 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂය අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.138,573 ක ණය ගෙවා තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික කාර්යසාධන වාර්තා

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව, අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ඔක්තෝබර් 15 දිනදීය.

## 1.5 වත්කම් කළමණාකරණය

### (අ) ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශ සංචිතයට අයත් ත්‍රී රෝද රථයක් වර්ෂය තුළ ධාවනයේ යොදවා නොතිබූ බව නිරීක්ෂණය විය.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් විකිණිය යුතු බව දක්වා තිබූ රු.1,380,633 ක් වූ වත්කම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ අතර ස්ථාවර වත්කම් ලේඛනයද යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(iii) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ඌනතාවයන් ලෙස හඳුනාගෙන තිබූ වර්ග 06 කට අයත් භාණ්ඩ අයිතමයන් 10 ක් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනා ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**(ඈ) <u>පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම</u>**

බදුකුලී ගිවිසුමක් යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශ කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර එම ගිවිසුමට පටහැනිව ගරාජයක් ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.264,544 ක වියදම ද ඇතුළත්ව ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සඳහා අවස්ථා දෙකකදී රු.350,361 ක් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වැය කර තිබුණි.

**(ඇ) <u>බේරුම් නොකළ බැරකම්</u>**

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු බැරකම් රු.2,728,697 ක් විය.

## 1.6 <u>අනුකූල නොවීම්</u>

**<u>නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | මුදල් රෙගුලාසි 1645/1646 | - | මාසික සංසිද්ධි වාර්තා හා වාහන 03 කට අදාල දෛනික ධාවන සටහන් 2012 වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවත් සංචිත වාහන 04 කට අදාල සමහර මාසවල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: | - | |
| | (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2:11 ඡේදය | | අමාත්‍යාංශයට අයත් වාහනවල සෑම මාස 6 කට වරක් ඉන්ධන දැවීම පරීක්‍ෂාකර නොතිබුණි. |
| | (ii) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 චක්‍රලේඛයේ 1(11) ඡේදය | - | ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව ලබා ගන්නා නිලධාරීන් 4 දෙනෙකු අමාත්‍යාංශය සතු සංචිත වාහනවලින් විධිමත් අනුමැතියකින් තොරව කි.මී. 2,405 ක ධාවන පහසුකම් ලබාගෙන තිබුණි. |
| | (iii) 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන චක්‍රලේඛය | - | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවකයින් පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර මගින් සනාථ කර නොතිබුණි. |
| **(ඇ)** | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ: | | |
| | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛයේ 6:1 ඡේදය | 13,130 | අමාත්‍යවරයා විසින් විදේශ සංචාරවලදී නියමිත රේටයන් ඉක්මවා සංයුක්ත දීමනා ලබා ගෙන තිබුණි. |

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්:

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(අ) වසර 43 ක් පැරණි සපුගස්කන්ද තෙල් පිරිපහදුව ඉතා අඩු ආන්තිකයක් මත ක්‍රියාත්මක වූ බැවින්, නූතන තාක්ෂණය යොදාගනිමින් නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිකර ගැනීම සඳහා නියමිත නවීකරණය හා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ඛනිජ තෙල් ආනයන නල පද්ධතිය වසර 40-70 ට පෙර සවිකරන ලද අතර ඒවා අකාර්යක්ෂම මට්ටමේ පැවතුනි. එහි සඵල ආයුකාලය වූ වසර 25 ක කාලය ඉක්මවා තිබීම හා මෙරට නිමි ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 2/3 ක් එම පරිහානියට පත් නල මාර්ගය හරහා සපුරාගනු ලබයි. රට හරහා දිවෙන නල මාර්ග ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂාකර තිබුණද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ඇ) මත්තල පිහිටි නව දක්ෂිණ ගුවන්තොටුපල සඳහා ගුවන්යානා ඉන්ධන ගබඩා කිරීමේ ටැංකි සංකීර්ණය සහ ගුවන්යානා සඳහා නැවත ඉන්ධන පිරවීමේ පහසුකම් ඇති භූගත නල පද්ධතියක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය 2012 නොවැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් එය අවසන් කර නොතිබුණි.

(ඈ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ භූගත තෙල් නල පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 1,000 ක වියදමින් තාක්ෂණික අධ්‍යයන අවසන් කර තිබුණද, එහි ඉදිකිරීම් කටයුතුවල තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 1.8 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

විගණනයට ඉදිරිපත් කළ ධාවන සටහන්වලින් හෙළිදරව් වූ කරුණු අනුව රාජකාරි කටයුතු සඳහා සංචිත වාහන යෙදවීමේ ප්‍රතිශතය සියයට 25 ට වඩා අඩු වීමත්, වාහන හා ඉන්ධන දීමනාව ලබාගන්නා නිලධාරීන් සඳහා සංචිත වාහන භාවිතා කිරීමට ඉඩ ලබාදීමත්, ධාවන සටහන් ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිශතය ඉතා ඉහල මට්ටමක පැවතීමත් මත අමාත්‍යාංශය සතු සංචිත වාහන උපයෝජනය මතභේදයට තුඩුදී තිබුණි. කෙසේ නමුදු රාජකාරි අවශ්‍යතා සඳහා සංචිත වාහන ප්‍රමාණවත්ද යන්න පිළිබඳව කිසිදු සොයා බැලීමකින් තොරව සංචිතය සඳහා ලබාගෙන තිබූ කුලී වාහන 02 ක් සඳහා වර්ෂය තුළ රු.852,512 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් වැයකර තිබුණි.

## 1.9 පාඩු හා හානි

අමාත්‍යාංශයට අයත් වාහන 02 ක සිදුවූ හදිසි අනතුරුවලින් රක්‍ෂණ වන්දි නොලැබීම මත සිදුවී තිබූ පාඩුව රු.160,778 ක් විය.

## 1.10 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගුවන් ටිකට්පත් වියදම අදාල විදේශ ආයතනයෙන් ගෙවන කොන්දේසිය මත ප්‍රංශයේ පුද්ගලික ආයතනයක් පෞද්ගලික කටයුත්තකට සහභාගි වූ අමාත්‍යවරයාගේ හා පෞද්ගලික ලේකම්ගේ රු.690,000 ක් වූ ගුවන් ටිකට්පත් වියදම අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණද, මාස 6 කට පසු ඉන් රු.178,156 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණ බැවින් එම ගනුදෙනුව නිසා අමාත්‍යාංශයට රු.511,844 ක පාඩුවක් සිදුවී තිබුණි. එසේම, මෙම දෙදෙනා සඳහා යැපීම් දීමනා හා අනියම් දීමනා ලෙස රු.548,682 ක් අමාත්‍යාංශය විසින් විදේශ ගමන් වියදම් යටතේ වැය කර තිබුණි.

(ආ) අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ 96 දෙනෙකු වෙනුවෙන් කට්ටල 10 ක් යටතේ වාර්ෂිකව පුවත්පත් 20,184 ක් ලබාගෙන තිබූ අතර 2012 වර්ෂය තුළ ඒ සඳහා රු.540,283 ක් වැයකර තිබුණි.

## 1.11 කළමනාකරණ දුර්වලතා

ධාවන සටහන්වල ඉන්ධන භාවිතය, ඉන්ධන දැවීම පරීක්ෂා කිරීම ආදිය පිළිබඳ සටහන් තබා නොතිබීම, ඉන්ධන තුලනය නිවැරදිව සිදුකර නොතිබීම, ලියන ලද සටහන් නැවත වෙනස්කර ලියා තිබීම හා ඉන්ධන ලේඛනයක් නඩත්තු කර නොතිබීම ආදී කරුණු අනුව අමාත්‍යාංශයට අයත් සංචිත වාහනවල ඉන්ධන භාවිතය විධිමත් පාලනයකින් තොරව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

## 1.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 |
| තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| ද්විතියික මට්ටම | 44 | 29 | 15 |
| ප්‍රාථමික මට්ටම | 27 | 20 | 07 |
| වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| එකතුව | 88 | 64 | 24 |

පුරප්පාඩු තනතුරු පිරවීමට ප්‍රමාණවත් පියවර නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු 24 ක් විය.

### (ආ) නිෂ්කාර්ය මානව සම්පත්

ව්‍යාපෘතිය 01 යටතේ අමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය අංශයෙහි අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් තිදෙනෙකු යොදවා තිබීම හා ඒ වෙනුවෙන් ව්‍යාපෘති 2 හි අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා වැය විෂයයන් යටතේ රු.761,572 ක් වැයකර තිබීම නිරීක්ෂණය විය. එසේම, මෙම තනතුරු 03 ක ව්‍යාපෘති 02 ක් යටතේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට ඇතුළත් කර අනුමත කරවාගෙන තිබුණද, 2012 වර්ෂය තුළ ව්‍යාපෘතිය 01 හෝ ව්‍යාපෘතිය 02 යටතේ අමාත්‍ය කාර්යාලය මගින් හෝ අමාත්‍ය පරිපාලනය මගින් කිසිඳු රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණි.

### (ඇ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මුරකරු තනතුරක් දරන සේවකයකු 2010 මැයි 04 දින සිට, පුරප්පාඩුවක් නොමැතිව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ගිණුම් අංශයට අනුයුක්ත කර තිබුණ අතර ඔහු වෙත අමාත්‍යාංශය විසින් කිසිඳු රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණි. එහෙත් මෙම සේවකයා ව්‍යාපෘති අංක 01 හි අමාත්‍ය කාර්යාලයේ සේවයේ යොදවා තිබූ අතර 2012 වර්ෂය තුළ ව්‍යාපෘති අංක 02 යටතේ වැටුප් වශයෙන් රු.263,345 ක් අධ්‍යාපන අමාත්‍යාශයට ප්‍රතිපූර්ණය කර තිබූ අතර, අතිකාල හා ගමන් වියදම් වශයෙන් රු.138,183 ක් ව්‍යාපෘති 01 යටතේ ගෙවා තිබුණි.